අමුතු සිහිනය

කර්තෘ - සවිදි සහස්නා දිසානායක

කතෘගේ නම- සවිදි සහස්නා දිසානායක
කෘතියේ නම - අමුතු සිහිනය
වයස- අවුරුදු 13
පාසල- මහ/ මාහාමායා බාලිකා විද්යාලය
කෘතිය පළ කර දිනය-2024-12-27

ISBN අංකය- IS38501

පිදුම

මෙම විද්‍යුත් පොත සෑදීමට මා හට උදව් උපකාර කර ගුරුබවතුන්ටත් ,දෙමව්පියන්ටත්,ශයිනි අක්කාටත්,දිනිතිටත් මෙම විද්‍යුත් පොත පුදන්නෙමි.

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝටිටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්වදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

(01)

ලිලී නම් කුඩා දැරියකි.ඇය නිශ්ශබ්ද චරිතයක් වන අතර ඇය පොත් කියවීමට අතිශය කැමති ය.ඇය දිනක් පුස්තකාලයට ගොස් මායා ලෝකය නම් පොතක් ගත්තා ය.ඇය එම පොත ගෙන භාගයක් කියවා එම වේලාවේ රෑවී තිබූ නිසා ආහාරයද ගෙන ඇය නින්දට ගියාය.

එක්වරම ඇය අවදි වී බලන විට සිටියේ කළුවර පාළු කැලෑවකයි.ඉන්පසුව ඇය දුටුවේ ඈතින් නිල් පැහැතිය එලියක් විහිදෙන බවයි.ලිලී එය වෙත ඇදුණි.ඉන් ඇතුලට ට මාර්ගයක් ඇති බව ඇයට දැනුණි.එය තේරුම් ගත් ලිලී එයින් ඇතුලට ගියාය.එවිට ඇය මතුවූයේ අමුතුම ලෝකයකිනි.එහි මායාකාරියන් තම මායා කොස්සෙන් පියඹමින් සිටින බව දුටු ලිලී පුදුමයට පත්විය.සියලු මායාකාරියන් ලිලී දුටු විගස 'ඔයාද අලුත් ළමයා එන්න අපි ඔයාට මායාපාසල පෙන්නන්නම් ' කීවෝය.'මායා පාසල, ඒ මොකක්ද ?'ලිලී කලබල වී දිව්වාය.එවිට එම පාසලේ ගුරුවරියක් වන මිස් ජෙනල් ඇයව ගෙම්බෙක් කළාය.'වී ලොක් සෙන්ඩර්' යන මායාව වචනය කියා ලිලීව ගෙම්බෙක් කළාය.එවිට ඇගේ පෙර හමුවූ මිතුරන් ගුරුවරියට විස්තර කියූ විට ගුරුවරිය නැවතත් 'යු වු සෙන්ඩ්‍රි' කියා ඇයව පෙර තත්ත්වයටම ගත්තාය.'හොඳයි ඔයාද අලුත් ළමයා එහෙනම්' ගුරුවරිය ලිලී ගෙන් ඇසුවේය.එවිට 'කවුද අලුත් ළමයා? මං දන්නෑ මාව එකපාරට මෙතනින් මතුවුණා'. ලිලී බයෙන් කියාගෙන ගියාය.'ඒ කොහොමද ?හරි කමක් නැහැ.දැන් ඔයාගේ යාළුවො ඔයාව ඔයාගේ කාමරේට එක්කන් යයි'.මිස් ජෙනල් කීවාය.එවිට ලිලී සතුටු වුවත් ඇයට ගෙදර යාමට අවශයයි.

ඇය ගුරුවරියට මෙසේ කීවාය.'මට ගෙදර යන්න ඕන,ඉක්මනටම.එවිට ගුරුවරිය ඇයට බැන ඇයගේ කාමරයට දමා වැසුවේය.පසුව ඇගේ මිතුරන් ගුරුවරියට හොරෙන් යතුරු රැගෙන ලිලීව එළියට ගත්තාය.ලිලී ගොඩක් සතුටු අතර ඇයව බේරාගත් මිතුරන් ඇගේ හොඳම මිතුරන් විය.ඔවුන් ලූසී සහ ජෙනී නම් විය.

(02)

'හරි අපි දැන් යම් දවල් ආහාරයේ ගන්න දැන්වෙලාව 11.35 යි.අපි ටිකක් පරක්කු වෙලත් එක්ක'ඒ ලූසී.'ඔව්මයි අපි යං 'ඒ ජෙනී.ලිලීද,මෙයට එකඟ වී දිවා ආහාරය ගැනීමට ගියාය.සියලු දෙනා දිවා ආහාර මේසය දැක දැක පුදුමයට පත්විය.එහි මස්,විවිධ බීම වර්ග,සුප් වර්ග,එළවළු වර්ග,පලතුරු වර්ග හා නොයෙකුත් ආහාර වර්ගද තිබිණි.සියලුම දෙනා ආහාර ගෙන තම මායා පන්ති වලට සහභාගි වූවෝය.මෙය තවමත් අදහාගත නොහැකිලිලි තම යහළුවන් පසු පස්සෙන්ම මායා පන්තිවලට සහභාගි වූවෝය.ඇයගේ පන්තියේ හොඳටමැජික් පුළුවන් වී තිබුණේ ජැක්ටයි.එම නිසා ජැක්සිටියේ උඩඟුවෙනි.එනිසා ජැක් ලිලීට පොඩ්ඩක්වත් කැමැති වූයේ නැත.එපමණක් නොව ලිලීගේ යහළුවෝ වෙන ලූසීටත් ජෙනීටත් ජැක් කැමති වූයේ නැත.පළමුවෙනි මායා පංතියට ලිලීත් එයාගේ යහළුවො දෙන්නත් සහභාගී විය.එයාලගෙ මායා පන්තිවල ඉන්න මිස් කෙනෙක්ගෙ නම මිස් .ස්මිත් . ඇයගොඩක් නපුරු කෙනෙක් වූවත් ඇයට තමයි මායා පාසලෙන්ම හොඳටම මැජික් පුළුවන් වී තිබුනේ.

මිස් ස්මිත් මෙසේ කීවා.හරි මගේ නම මිස් ස්මිත් මම තමයි ඔයාලගේ මායා පාසලේ මැජික් උගන්වන්නේ හරි මුලින්ම ඔයාලා මට හඳුන්වා දෙන්න ඊට පස්සේ අපි මායා පන්තිය පටන් ගනිමු'.මුලින්ම ඉදිරිපත් වූයේ ජැක් 'මිස් ස්මිත් මටතමයි දැනට හොඳටම මැජික් පුළුවන් .' හොඳයි ජැක් ඉඳගන්න ' මිස් ස්මිත් කීවාය.හරි ඊළඟ කෙනා කවුද?මම ලූසි, මම ලිලී, මම ජෙනි ,සියලු දෙනාම තමනම් කියාගෙනන ගියෝය.ඔවුන්ගේ මායා පංතියේ ළමයි12 කට ආසන්න ළමයි ගණනක් සිටිති.එසේම ජැක්ගේ අහංකාර යාලුවන් වන ජෝන්, පීටර්, එමිල් හරිම මෝඩයි.එයාලට හරියට වැඩක් වත් කරගන්න බැහැ කියලා ජැක් හැම වෙලාවෙම එයාලට බනිනවා.හැමෝම තමාව හඳුන්වා දුන්නට පස්සේ මිස් ස්මිත් මායා පංතිය පටන් ගත්තා.මිස් ස්මිත් හැමෝටම පූසෙක් නැති කරන්නේ කොහොමද කියලා ඉගැන්නුවාපූසෙක් නැති කරන මායා වචනය තමයි පෙට්ටාසියම් කෙල්රො.ඒක හරියටම ජැක්. මිස් ස්මිත් ජැක්ට හොඳ කිව්වා.ඒ නිසා ජැක් තවත් උඩගු උනා.ලිලී උත්සාහ කළත් ඇයට බැරිවුණා. ඒද වෙනුවට සිදුවූයේ පූසාගේ පාට වෙනස් වීමයි. ඒ නිසා හැමෝම ලිලීට හිනා වුවත් තම යහළුවන් ඇයට කියලා දීමට උත්සාහ කළා.ඉන්පසුව දෙවැනි මායා පන්තියට යන සීනුව නාද වූවා.'දැන් වෙලාව 1.30යි.අපි යං ඊළඟ මායා පංතියට' ලූසී කීවා.'ඊළඟ මායා පන්තිය කරන්නේ කවුද?' ලිලී ඇසුවාය.'ආ මට මතක විදිහට මිස් ජෙනල් .අර ඔයා ආව වෙලාවේ හමුවුණු ගුරුවරිය එයා තමයි කරන්නේ.'මෙසේ කීවේ ජෙනී.හොඳයි අපි යමුකෝ....ලිලී පිළිතුර දුන්නේ බයකින් සහ ලැජ්ජාවකිනි.

(03)

'මට මැජික් බැහැ දැක්කද අර පන්තියේදි හැමෝම මට හිනාවුණා. මට ගෙදර යන්න පුළුවන් නම්' ලිලී කීවේ දුක කිනි.'ඔයාට මැජික් බැරිනම් ඔයා කොහොමද අර පූසගේ පාට මාරු කරේ.' එහෙම කීවේ ලූසී.' ඒක තමයි'ජෙනීද පිළිතුරු දුන්නාය.'එත්.....හරි එහෙනම් අපි යං මිස් ජෙනෙල්ගේ පන්තියට 'ලීලී එකඟ වූවාය.මිස් ජනෙල් ගේ පන්තියේ උගන්වන්නේ නැතුව අද දිනට පමණක් පාසල නැරඹීමට එක්කන් යන එක පිළිබඳව හැමෝම සිටියේ සතුටින්.ඒත් මිස් ජන ලිලීව දුටු සැනින් තරහවක් පෑවේය එම නිසා ලිලී සිටියේ දුකකිනි.පළමුව ඔවුන් යන විට මිස් ජෙනල් බිත්තියේ තිබූ සිතියමක් පෙන්වීය . සියලු දෙනා එය බලා පුදුමයට පත්විය.



ලිලිට මේ පාසල ගැන ගොඩක් ආස හිතුණා. මිස් ජෙනල් එයාලව මුලින්ම එක්කන් ගියේ පාසල් පිටියටයි. හැමෝම ඒ පිටිය දැකලා එහෙ මෙහි අද දිව්වා. ඒත් මිස් ජෙනල් හැමෝටම මෙසේ කිවාය.කවුරුත් දුවන් නැතුව මෙහේ එන්න කියනවා. විනය ගරුක ලෙස හැසිරෙන්න එහෙම නැත්නම් කළුවර කාමරයට දාලා වහනවා 'හැමෝම මෙයට බයවී පෙර ගැසී නිශ්ශබ්දතාවයද රැක්කෝය.දෙවෙනියට මිස් ජෙනල් ළමයින්ගෙ එක්කන් ගියේ මායා පාසලේ පුස්තකාලයටයි මේ පුස්තකාලේ ගොඩක් ලොකුයි. ඒ වගේම මේ පුස්තකාලේ තහනම් කලාවකුත් තිබ්බා මේ තහනම් කලාපෙ කාටවත්ම යන්න දෙන්නේ නැහැ. මේ පුස්තකාලෙ තහනම් කලාපයට කවුරු හරි ගිහින් තිබ්බොත් එයාව දින දෙකකට කළුවර කාමරයට දානවා ඇය තම හඬ අවදි කර ළමයින් බිය ගැස්සූහ.ලිලීත් මෙයට බිය වුහ.ඉන් පසුව ළමයින්ට පොත් කිරීමට ඉඩ දුන් පසු සියලුම දෙනාව එක්කන් ගියේ නැවතත් පන්තියට මොකද කිවහොත් ඊළඟ මායා පන්තියට යන්න වෙලාව හරි නිසයිඔයාලට නිදහස් වෙලාවක පුළුවන් පාසලේ අනිත් තැන් බලන්න යන්න' මිස් ජෙනල් කිව්වාය.මේ ගැන අහලා ලිලීත් ලුසීත් ජෙනීත් සතුටු උනා.

(04)

දැන් වේලාව කීයද ?ලුසි' ලිලී ඇසුවාය .'දැන් වෙලාව 4.00 යි'.ලුසී කිව්වාය. මේ පාසලේ කාලසටහන දන්නෑනේ' ලිලී කිව්වා'.ආ මං ගාව තියෙනවා .ඉන්න මම කියන්නම් 'ජෙනී කිව්වා.මෙය දැක ලිලී පුදුමයට පත්විය.

මායා පාසලේ කාලසටහන

5.30=උදෑසන නැගිටීම
6.00=පාසලට පැමිණීම
6.00-6.30=මිස්ටර් .නෝන්ගේ පන්තිය පන්තිය
6.30-7.00=මිස්ටර් ලොන්ගෙ පන්තිය
7.00-7.30=මිස්ටර් ස්පාක්ගෙ පන්තිය
7.30-8.00උදෑසන ආහාර ගැනීම
8.00-9.00=විවේක කාලය
9.00-11.30=කැමති SPORT එකක් කිරීම
11.30-12.00=දවල් ආහාරය ගැනීම
12.00-1.00= මිස් ජෙනල්ගේ පන්තිය.
1.00-2.00=පුස්තකාලයට යෑම
2.00-3.30= විදුහල්පතිගේ පන්තිය
3.30-4.30=මිස් ස්මිත්ගේ පංතිය
4.30-5.30=විවේකය
5.30-7.30=පොත් පාඩම් කිරීම
7.30-8.00=රෑ ආහාරය ගැනීම
8.00-9.00=ගෙදර වැඩවල නිරතවීම
9.00=නින්දට යාම.

ලිලී ද මෙම කාලසටහන තම පොතේ සටහන් කර අනතුරුව පුස්තකාලයට ගියාය.'දැන් තියෙන්නේ විවේකය නේද? අපට එහෙනම් ගොඩක් වෙලා පොත් කියවන්න පුළුවන් වෙයි' ලිලී කීවාය. 'ඔව් ඒක ඇත්ත' ලූසි ජෙනින් මෙයට එකඟ වූවාය.ලිලී හිටපු ලෝකෙට යන්න ඕන නිසා පුස්තකාලයෙන් පොත් කියවන්න පටන් ගත්තා.

. එයා පොත් කියවන්න ආස බව මතක් වීමත් සමඟම මිනිස් ලොව සිටියදී ලිලී කියවූ පොතේ ඇති දේවල් සිදුවන බව ලිලීට තේරුම් යාමට වැඩි කාලයක් ගත වූයේ නැහැ.එම පොතේ ඇති චරිතය ලිලී බව මතක් වූ විට ඇය සියලු විස්තර තම මිතුරන්ට පවසා සිටියාය.එවිට ඔවුන්ට මේ පිළිබඳ පුදුමයක් ඇති වූවායය. එක්වරම මෙයට විසඳුමක් අවශය නිසා ඔවුන් තිදෙනාම එකතු වී පුස්තකාලයේ සෑම පොතක්ම පාහේ කියවා බැලුවත් කිසිදු විස්තරයක් සොයාගත නොහැකි විය. මෙය නිසා ලිලී දුකට පත් වී සිටියාය. එක්වරම මේ බලාසිටි ජැක් මෙතනට පැමිණ මට ඔයත් එක්ක තරහක් නෑ ලිලී.මම ඔයත් එක්ක යාලුයි.මං දන්නවා ඔයාට ඕනේ ඔයාගේ ලෝකෙට යන්නනේ.ඔයාට ඒ ගැන දැනගන්න නම් දැනගන්නනම් ඔයාට තහනම් කලාප තියෙන පොත් කියවන්න වෙනවා. එතන තමයි ඒ පොත් තියෙන්නේ'කීවේය.මාත්යත් එක්ක තරහ නෑ ජැක් ඒත් ඒ පැත්තට ගියොත් මාව මායා පාසලෙන් ඉවත් කරයි' ලිලී කිවේ බියකිනි.ඊට පසුව ජැක් කිවේ 'ඔයා මේ ලොකෙන් ගියාම මේ මායා පාසලෙන් වැඩක් නැහැනෙ'කියලයි.හරි,බලමුකෝ ...ලිලී කිවාය.ලූසී නම් මෙයට පොඩ්ඩක්වත් කැමති වූයේ නැත. ලූසී කිව්වේ මෙහෙමයි '

ඔයා එයා කියන දේ අහන්න එපා. එයා ඔයාව මායාපාසලෙන් ඉවත් කරන්නයි හදන්නේ'.ඒත්....එයා කිව්වනේ මට යන්න පුළුවන් වෙයි කියලා 'ලිලී කීවේ විශ්වාසයෙනි.ලිලී මේ අවස්ථාවේදී අකීකරු වන නිසා ලූසීට හා ජෙනිට මෙයට එකඟ වීමට සිදුවිය.

හරි අපි උත්සහ කරලා බලමු. ඒත් නොපෙනී යන මායාකුඩු අපට ඕන වෙනවා. ඒවගෙන් විතරයි අපිට නොපෙනී යන්න පුළුවන්. එතකොට කාටවත්ම අපිව පේන්නේ නැහැ. හැබැයි වැරදිලාවත් මිස් ජෙනල් ට අහු උනත් අපි ඉවරම තමයි'ජෙනී කිව්වාය.' ඔව් ඒක ඇත්ත ඒත් අපි කොහොමද මායා කුඩු හොයා හොයාගන්නේ' ලිලී ඇසුවේ බලාපොරොත්තු කඩ කර ගනිමිනි. එවිට ලුසී නම් කීවේ මිස් ස්මිත් ලඟ එම මායා කුඩු ඇති බවයි. පසුව මිස් ස්මිත්ගේ පන්තියේදී මායාකුඩු ගැනීමට මොවුන් තිදෙනා සිටියාය. මෙය අසාර්ථක වී මිස් ස්මිත්ගෙ අතටම මොවුන් තිදෙනා අසුවිය .'හොඳයි එහෙනම් ඔයාලා තුන්දෙනා ආවේ මගේ මායා කුඩු අරගන්නයි,හරි මොකටද ඔයාලා මගේ මායා කුඩු ගන්න ආවේ.? මට කියන්න නැත්තම් මං දඩුවම් කරනවා.මිස් ස්මිත් තරහා පෙන්විය.' මිස් ස්මිත් ,අපි හැදුවේ ඒවාගෙන් ඇත්තටම නොපෙනී යන්න පුළුවන්ද කියලා බලන්න' ලිලී මුල්විය. ඔය ඇත්තමද කියන්නේ ? මිස් ස්මිත් ඇසුවාය.'ඔ..ව්.....ම්..ස්..ස්..මි...ත් ...ලිලී කීවේ ගොතගසමින්.'හරි ඔයාලට යන්න පුළුවන්.....පොඩ්ඩක් ඉන්න ඔයාලට මම මැජික් කුඩු ටිකක් දෙන්නම්. හැබැයි වැරදි වැඩවලට පාවිච්චි කරන්න බැහැ. තේරුනාද ? මිස් ස්මිත්ගෙ කරුණාව පහළ විය. මෙය ගැන ලිලී ද ලුසී ද ජෙනී ද ගොඩක් සතුටින් සිටියහ. ජැක් ලිලී සමග යාළු වුවද, එය ජැක් විසින් ලිලීව පාසලෙන් ඉවත් කිරීමට ගත් උපායක් බව තාමත් ලිලීට නම් තේරුම් ගියේ නැත.ඒත් මේ ගැන දෙපාරක් සිතන බව ලුසි ලිලීට කීවත් ලිලීට තිබෙන්නේ ගෙදර යන එක පමණක් නිසා ලිලී එක පයින්ම මෙයට කැමති විය. ලිලී මේ මායාකුඩුත් රැගෙන පුස්තකාලේ තහනම් කලාපයට යන්න සූදානම් වුණත් එවිට සවස් වී තිබෙන නිසා හෙට දෙන උදෑසනම මෙය කීරිමට යන බව සිතා මොවුන් තිදෙනා රෑ ආහාරය ගැනීමට ගියහ.වෙනදා මෙන් ආහාර මේසය ආහාර වලින් වර්ණවත් විය. සියලු දෙනා ආහාර ගැනීමෙන් අනතුරුව සතුටින් නින්දට ගියහ.

(05)

ඊළඟ දින උදෑසන 4.00පමණ නැගිට මොවුන් තිදෙනා තමන් විසින් කිරීමට බලාපොරොත්තු වන දෙය ගැන සතුටු විය.මෙයට ලිලී සතුටු වුවත් ඇයට තම දෙමව්පියන් මතක් වී ඇඩුනි. ලුසී සහ ජෙනී එක්ව ලිලීව සැනසුහ.ඉන්පසුව මිතුරන් තිදෙනාට අසතුට ආරංචියක් ලැබුණි.පුස්තකාලයේ දොරටුවේ මෙසේ ලියා තිබුනේ ය.



අද දින සිකුරාදා වන නිසා පුස්තකාලේ වසා ඇති බව මොවුන්ට තේරී ගියහ.සිකුරාදා දින මායා පාසලේ පුස්තකාලාදිපතිනිය මායා කාර්යාලයට යන බැවින් එදින පුස්තකාලය වසා ඇති බව ලිලීට ජෙනී කීවාය.මෙයින් ශෝකයට පත්වූ ලිලී තම කාමරයට ගොස් ජනේලය දෙස බලාගන්නට පටන්ගත්තාය.

(06)

එදා දින හැලොවීන් නිසා මායා පාසල වර්ණවත් ලෙස සරසා තිබුණි.මෙම නිසා මෙම උත්සව දිනයට සකසන බීම වර්ග,මස් වර්ග,සුප් වර්ග,ටොපි වර්ග විතරක් නෙවෙයි විශේෂ කෑම වර්ග ද තිබුණා. මේ නිසා ලිලීගේ දුක ටිකක් නිවී තිබුණාය.රෑට මෙයාලා තිදෙනා ම ටොපි වර්ග එකතු කරන්න පාසල පුරා ඇවිදිමින් සිටියහ. ඒ අතරතුර විවිධ සැරසිලි දක්නට ලැබුණේය.මේ තිදෙනාට ගොඩක් ටොපි ලැබුණහ .ඉන්පසුව මොවුන් තිදෙනා නින්දට ගියහ .



(07)

ඊළඟ දින උදෑසන තවමත් බලාපොරොත්තු රහිතව සිටින ලිලී දැක ලුසී සහ ජෙනී ඇයව සැනසුවාය.කාලසටහන අනුව වැඩ කර උදේ 8.00-9.00 වන විවේකය පටන් ගන්නා විටදී ලුසි ,ජෙනී සහ ලිලී එක්වරම දිව ගියේ පුස්තකාලයටයි.ඒත් අවාසනාවන්ත බව නිසා එම තහනම් කලාපයට ඇතුල්වීම සඳහා මිස්ටර් ලොන් සූදානම් වී සිටියේය.ලුසී ,ජෙනී, ලිලී යන තිදෙනා මායාකුඩු ඉසාගෙන සිටින නිසා කාටවත්ම මොවුන් තිදෙනා පෙනුනේ නම් නැත.'මේ තහනම් කලාපෙට යන්න තහනම්නෙ ,ඉතින් මිස්ටර් ලෝන් කොහොමද මෙකේ ඇතුලට යන්නේ?ලිලී මිමුණුවාය.ලුසී සහ ජෙනී ද මෙයට එකඟ වූහ .එකපාරටම ලිලී අතින් එතන තිබූ පොතක් වැටුණාය.මිස්ටර් ලෝන් බයවී එතනින් ඉක්මනට පිටවී ගියේය.ඉක්මනට තහනම් කලාපයට ගිය මේ තිදෙනාට ඇතිවූයේ මහත් බියකි. එහි අමුතු පොත් තිබුනේය.ඒවා තුළ ආත්ම සිර කර තිබෙන බව ලිලීත්,ලුසීත්,ජෙනීත් නොදැන සිටියහ .මෙම හේතුව නිසා අතීතයේ මෙම කලාපය තහනම් කලාපයක් ලෙස නම් කර තිබුණි.එහි තිබූ එක් පොතක් අතට ගත් ලිලීට උරුම වූයේ කියාගත නොහැකි අත්දැකීමකි.එම පොතේ ඇති ආත්මය එළියට පැමිණ ලිලී,ලුසී,ජෙනී පසුපස පැන්නුවේය.

ඔවුන් තිදෙනා දිව යන අතරතුර මිස් ජෙනල්ගේ ඇඟේ හැප්පි ලිලී අත තිබූ පොත බිම වැටුණි.මෙය තේරුම් ගත් මිස් ජෙනල් එම ආත්මය නැතිකර දැමුවාය.ඊළඟට සිදුවන්නේ කුමක්දැයි කිසිදු කෙනෙකුට සිතා ගත නොහැකි විය.දින දෙකකට මිස් ජෙනල් ඔවුන් තිදෙනාව කළුකාමරයකට දමා වැසුවේය. පසුව ඔවුන්ගේ අතේ තිබූ පොත නැවතත් තහනම් කලාපයට දැමීමට මිස් ජෙනල් කටයුතු කළාය. ඔවුන් එම දඬුවමෙන් හොඳටම බියපත්පත් වූහ .මිස් ස්මිත් මොවුන් ගැන පිරිකුලක් ඇතිකරගත්තේ තමාගේම මායාකුඩු තමා අවවාද කර තිබියදී රැගෙන නරක වැඩකට යෙදවූ නිසාය.

(08)

ඊළඟ දිනත් සුපුරුදු කාලසටහනටම වැඩ සිදුවිය.සියලුම ගුරුවරුන් ලිලී, ලුසි,ජෙනී ගැන පිළිකුලක් ඇතිකර ගත්හ.තමාගේ ලෝකයට යන බලාපොරොත්තුව සුන්විම නිසා ද,සෑම ගුරුවරයෙක්ම තමා ගැන පිළිකුලෙන් සිටින නිසා ද ලිලීට ඇඬුණි.තමාව මිස් ජෙනල්ට අසු කිරීමට ජැක් මෙවැනි දෙයක් කළ බව පසුව ලිලීට තේරුම් ගියාය.එක් වාරම ක්රීඩා පිටියට ගිය ලිලීට මතක් වූයේ තමා පැමිණි තැනින්ම නැවත යෑමේ හැකියාව ඇති බවයි.ඒත් එතන කිසිම දෙයක් නොතිබුණේය.මිස්ටර් ලෝන් තහනම් කලාපයට ඇතුළු වීමට ගිය බව මතක්වූ ලිලී එය කාටවත්ම නොකියා සිටීමට අදිටන් කර ගත්තාය.ලිලී මායා හොකී බැඳෙන්න සූදානම් විය.එහි පුහුණුකරු ලෙස සිටියේ මිස් ජෙනල් .මෙහිදී මායා යෂ්ටිය දික් කර හොකී පිත්ත සාදා ගැනීම සිදුවේ.

"මැක්ඩෝරා කේලාරෝ මෙහෙම කියලා තමයි මායා යෂ්ටිය හොකී පිත්තක් කරගන්නේ හරියට කරන්න"මිස් ජෙනල් අණ කළාය .ලිලී තමාගේ ලෝකයේ සිටියදීද පාසල් හොකී කණ්ඩායමේ සිටීම නිසා ඇයට මායා හොකී අමාරු නොවිණි. ජැක්ට වඩා ලිලීට හොකී පුළුවන් නිසා ඇය මේ සැරේ ජැක්ට වඩා ඉදිරියෙන් සිටියාය.එම නිසා ජැක්ට ඊර්ෂ්යාවක් ඇති විය.මෙය හොඳින්ම සිදු කළේ ලිලී. එම නිසා ඇයව මායාපාසලේ හොකී කණ්ඩායමට දැමීමට මිස් ජෙනල් කටයුතු කළාය.මෙය නිසා ජැක් ඇයට තමාව අතුරුදහන් කරන ලෙස අභියෝග කළේය.ඔවුහු මෙසේ කීවේය.' ඔයා මාව අතුරුදහන් කරලා පෙන්නුවොත් මං පිලිගන්නවා ඔයා වැඩිඩෙක් කියලා මං ඔයාට අභියෝග කරනවා ඔයාට ඒක කරන්න බැහැ'ජැක් කීවේ කපටිකමකිනි.ඇය ජැක්ව අතුරුදහන් කිරීමට සැරසුණත් මිස් ජෙනල් පැමිණීම නිසා එය අඩාල විය.මම ඊළඟ දවසේ ඔයාව අතුරුදහන් කරන්නම්කෝ' ලිලී කීවා ය.

ලිලී එසේ පැවසුවත් ජැක්ව අතුරුදහන් කරන ආකාරය ලිලී නොදැන සිටියාය.

(09)

ඊළඟ දින ජැක් නොදෙවෙනි වීමට අකමැති ලිලී පුස්තකාලයට ගොස් අතුරුදහන් කිරීමට සුදුසු මැජික් ඇති පොතක් සොයමින් සිටියදී එහි තිබූ පොතකින් ඇය සතුටට පත්විය. හේතුව නම් එම පොතේ තමාගේ ලෝකයට යෑමට මායාවක් ඇති නිසයි.නමුත් එයට මායා දියරයක් සෑදිය යුතුය' මට ජැක්ව අතුරුදහන් කරන විදිය වැඩක් නැහැනේ,මම ඉස්සෙල්ලාම මගේ ලෝකෙට යන්න ඕන ඒ නිසා මම ඉස්සෙල්ලාම මේක හදාගන්න ඕන' ලිලී කීවේ හිතේ ධෛර්ය ඇතිවයි. එහි තිබුණේ මෙවැනි දේවල්ය.

මායාකුඩු ස්වල්පයක්
මැරුණු මීයෙක්
මායා පැළෑටි
විශේෂිත මායාකුඩු

'ඒත් මං කොහොමද මේවා හොයා ගන්නේ. විශේෂිත මායාකුඩු කොහොමද හොයාගන්නේ? මට මතක විදිහට ඒ මායාකුඩු ජාතිය මිස් ජේන් ගාව තියෙනවා .ලිලී සිතුවාය. කෙසේ හෝ ජේන් මහත්මිය නොමැතිවෙලාවක ඇගේ කාර්යාලයට ගොස් මායා කුඩු ගත් ලිලී මීයෙක්ද කූඩුවකට හසු කරගත්තාය.ඉන්පසු එම මීයාව විශේෂිත මායාකුඩු ද ගත් ඇයට විශේෂිත පැළෑටි වර්ගය අමතක වී ගියාය.එම ද්‍රාවණය විසිරී යන ආකාරයට දැමූ විට දොරටුවක් නිර්මාණය වන අතර තමාට යාමට අවශ්‍ය ස්ථානය සිහියට ගෙන එම දොරටුවෙන් ඇතුලට යාමට අවශ්‍ය බව එම පොතේ සඳහන් වී තිබුණේය.එවිට තමන්ට තමාගේ ලෝකයට නැවත යා හැකි බව ලිලී දැනගත් පසු ඇය සතුටට පත්විය.ඇය මායා පැළෑටි නොමැතිව එය සාදා ඈතට විසිරී යන පරිදි සිදු කරත් කිසිවක් සිදුවූයේ නැත.නැවත මුල සිට මතක් කල ඇයට මායා පැළෑටි නොදැමූ බව මතක් විය .

මායාකුඩු නොමැති බව දැන ගත් ඇය උපායක් කල්පනා කළාය.මිස් ස්මිත් පෙරදී ද අවවාද මායාකුඩු ගත නොහැකි වේදැඹයි සිතා ලිලී දුකට පත්විය.'මට කලින් පාර මිස් ස්මිත් මායා කුඩු දුන්නට මේ පාර නම් කොහොමත්ම දෙන්නේ නැහැ. දැන් මං මොකද කරන්නේ?....

සමහරවිට මේකට ජෙනී ගාවා හරි ලුසී ගාව හරි උත්තරයක් ඇති..එසේ කියා ජෙනී සහ ලුසි සෙවීමට ගිය ලිලී මෙම ගැටලුව ඔවුන්ට කියා සිටියාය.ජෙනී මෙසේ කිව්වාය. 'ඔයා දන්නවනේ මිස්ටර් ස්පාක් අර උස,සුදු,රැවුල තියෙන මායා පන්තියේ ගුරුවරයා.එයා ගාව තියෙනවා ,හැම ගුරුවරයෙක් ගාව තියෙනවා. ඒත් ගන්න ලේසි වෙන්නේ මිස්ටර් ස්පාක්ගෙන් විතරයි' 'හරි මං බලන්නම්'.ලිලී කීවාය.ලිලී මිස්ටර් ස්පාක් වෙත ගොස්' මිස්ටර් ස්පාක් ඔයාට මිස් ජෙනල් එන්න කිව්වා' යනුවෙන් බොරුවක් කීවාය.ඉන්පසු මිස්ටර් ස්පාක් ' හරි. මම එන්නම්' කිවේය.මිස්ටර් ස්පාක් ගිය පසු ලිලී මායා කුඩුදු රැගෙන ඉක්මනට තම කාමරයට ගියාය.

(10)

නැවතත් එය සෑදීමේ බලාපොරොත්තුවෙන් සිටින ලිලී මියෙක් ද අල්ලා ගත්තාය.පසුව ඇය කඩිනමින් දිව ගියේ මායා ගෙවත්තටයි. ඇය මායා පැළෑටි කැඩීමට ගිය අවස්ථාවේදී එතනට මිස් ජෙනල් පැමිණියාය.' මොකද මෙතන කරන්නේ ලිලී , ඔයා මොකටද මායා පැළෑටි කඩන්නෙ 'මිස් ජෙනල් ඇසුවාය. එක්වරම ලිලී තිගැස්සුනාය.' ම..ම..මෙ.. ආසා....ව..ට.. ගන්..නෙ..' ලිලී ගොතගැසුවා ය .මට ඇත්ත කියන්න ලිලි' මිස් ජෙනල් දරුණු ලෙස ඇසුවාය.එවිට ලිලී බියවී මං ඇත්ත තමයි කියන්නේ' කීවාය.' හොඳයි,දැන් වෙලාව 11.30 .ඔයාට දැන් දවල් ආහාරය ගන්න තියෙන්නේ, ඉක්මනට යන්න' මිස් ජෙනල් කීවාය.ලිලී මොකුත් නොකියා එතනින් පිටව ගියාය.මේ පිළිබඳ මිස් ජෙනල් සැක කළාය.ඉන්පසුව අවශ්ය උපකරණ සියල්ල තම කාමරයෙන් තබා ඇය දිවා ආහාරය ගැනීමට ගියාය. ඇයගේ සියලුම දේ නිවැරදිව සිදුවූ බවත් ඇයට තම ලෝකයට යෑමට වෙලාව පැමිණි ඇති බවත් ලිලී ජෙනී සහ ලුසීට කිව්වාය. ඒත් තමාගේ යාලුවා නැවත යන නිසා ඔවුන් දෙදෙනා නම් සිටියේ දුකකිනි. දවල් ආහාරේ ගත් පසු කඩිනමින් ඇය තම කාමරයට ගිය විට එතනට පැමිණ සිටී මිස්ටර් ස්පාක් ' ඔයා මට කිව්වා නේද මිස් ජෙනල් මට කතා කරා කියලා,ඒත් මිස් ජෙනල් මට කතා කරේ නැහැලු..ඔයා මට බොරු කිව්වද? ඇසුවේ ය.. ' නැහැ, නැහැ මිස්ටර් ස්පාක් ,මිස් ජෙනල් කතා කරා..ඔයාට නෙවෙයි මට වැරදිලා තමයි ඔයාට කිව්වේ .සමාවෙන්න'.වෙන කිසි දෙයක් කීමට නොමැති හෙයින් ලිලී මිස්ටර් ස්පාක්ට එසේ කිව්වාය.පසුව මිස්ටර් ස්පාක් එතනින් පිටව ගියේය. ඊළඟට එම දේවල් සියල්ල එකට දමා රත් කර සිටීමින් ලිලී සිටියාය.

ඇය එය රත්කර කර සිටින අතරතුර මිස් ජෙනල් පැමිණි අතර සම්පූර්ණ විස්තරය කීමට ලිලීට සිදුවිය.ඉන්පසුව මිස්ටර් ලොන් තහනම් කලාපයට ඇතුළු වීමට ගිය බවත්,තමාගේ ලෝකයට යන්න මෙම ද්රාවණය සෑදූ බවත් ඇය මිස් ජෙනල් ට කියා සිටියාය. මිස් ජෙනල් ලිලීට දඬුවම් නොකර මිස්ටර් ලොන්ව කුටියක සිර කළේය.සියල්ල හොඳින් සිදුවීම ගැන ලිලී සතුටට පත්විය. පසුව මායා පොතෙහි ඇති ආකාරයට එම ද්රාවණය විසිරී යන පරිදි විසි කර තමාගේ ලෝකයට යා යුතු බව අදිටන් කර ගත් විටම දොරටුවක් නිර්මාණය විය.ඇය තම ලෝකයට යන්නට වෙලාව පැමිණි ඇති බව තම යහළුවන් වෙත පවසා ඇයගේ යහළුවන්ගෙන් සමුගත්තාය.ඇය යන විට ජෙනී සහ ලුසි ඇඬූ අතර ඔවුන් ලිලීට මාලයක් තෑග්ගක් වශයෙන් දුන්නහ.එයින් සතුටු ලිලී දොරටුවෙන් තම ලෝකයට ගියාය.

ඇය එක්වරම ඇහැරුණි.එය සිහිනයක් බව තේරුම් ගත් ඇය බොහෝ සතුටට පත්විය.ඉන් පසුව ඇය මායා ලෝකය නම් පොතේ ඉතුරු භාගයද කියවා අවසන් කළාය.එම පොතේ තමා සිදුකර ඇති දේවල් ඇති බව තේරුම් ගත් ලිලීට මෙය ජීවිතයේ අමතක නොවන සිහිනයක් විය .

සමාප්තයි!

පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ගුන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්